# ශ්‍රී ලංකාව තුළ පුරවැසි සහභාගිත්වය ශක්තිමත් කිරීම මොඩියුලය

ජාතික සාම මණ්ඩලය

# අන්තර්ගතය

හැඳින්වීම ...... 3
වෙනස පිළිබඳ න්‍යාය ...... 4
න්‍යාය පත්‍රය ...... 5
01 වන සැසිය ...... 7
සැසියෙහි මාතෘකාව: මූලික සංකල්ප පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන්ගේ දැනුවත්භාවය වැඩි කිරීම ...... 7
02 වැනි සැසිය ...... 11
සැසි මාතෘකාව: සමාගමයේ  නිදහසෙහි නෛතික පසුබිම පිළිබඳව දැනුවත්භාවය වැඩි කිරීම ...... 11
03  වන සැසිය ...... 12
සැසියෙහි මාතෘකාව: ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශයෙහි තත්ත්වය අවබෝධ කර ගැනීම ...... 12
04 වන සැසිය ...... 13
සැසියේ මාතෘකාව: මැදිහත්වීම් සිදු කරන ප්‍රජාවේ ගතිකයන් අවබෝධ කර ගැනීම සඳහා විශ්ලේෂණ මෙවලමක් හඳුන්වාදීම ...... 13
05 වන සැසිය ...... 15
සැසියේ මාතෘකාව: මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම පිළිබඳ පුහුණුව ...... 15
ඇමුණුම් ...... 16
ඇමුණුම 01: පුරවැසිභාවය පිළිබඳ සිද්ධි අධ්‍යයන ...... 16
ඇමුණුම 02: සමාගමයේ නිදහස - වීඩියෝ සබැඳි ...... 17
ඇමුණුම 03: විශ්ලේෂණ මෙවලම ...... 21
ඇමුණුම 04: ආදර්ශ කතාන්දරය ...... 23
ඇමුණුම 05: මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශය ...... 24

# හැඳින්වීම

මෙම පුහුණු මොඩියුලය නිර්මාණය කරන ලද්දේ ජාතික සාම මණ්ඩලයේ ප්‍රජා අවකාශය සහ සමාගමයේ නිදහස ශක්තිමත් කිරීම සඳහා වන ව්‍යාපෘතියේ කොටසක් ලෙස ය. මෙම ව්‍යාපෘතියෙන් පුරවැසි සහභාගිත්වය තහවුරු කිරීමේදී ප්‍රාදේශීය මට්ටමේ පවතින/තිබිය හැකි සමාජ ව්‍යාපාර වලට සහාය දීම සහ ඔවුන් මුහුණ දෙන නිශ්චිත අසාධාරණයන්ට එරෙහිව ජනතාව සටන් කරන විට ප්‍රාදේශීය මට්ටමින් සමාගමයේ  නිදහස සුරක්ෂිත කිරීම "ප්‍රධාන පුහුණුකරුවන්" ලෙස හඳුන්වන තමන්ගේ කලාපීය මට්ටමේ පුහුණුකරුවන්ගෙන් ජාතික සාම මණ්ඩලය අපේක්ෂා කරයි.

මෙම විශේෂිත කාර්යය සඳහා ප්‍රධාන පුහුණුකරුවන් සූදානම් කිරීමට මෙම පුහුණු මොඩියුලය සැලසුම් කර ඇත. පුහුණුව දින දෙක හමාරක් තුළ නේවාසික වැඩමුළුවක් ලෙස පැවැත්වේ. පුහුණුවෙන් පසුව, පුහුණුවෙන් ලබා ගත් දැනුම උපයෝගී කර ගනිමින්, ප්‍රධාන පුහුණුකරුවන් කලාපීය මට්ටටමින් වැඩ කිරීම අපේක්ෂා කරයි.

මෙම මොඩියුලය සකස් කරන ලද්දේ මෙම ව්‍යාපෘතියෙහි මූලික පර්යේෂණ සංරචකය සිදු කළ පර්යේෂණ කණ්ඩායම විසිනි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම මොඩියුලය නිර්මාණය කිරීමේදී මෙම අධ්‍යයනයේ සොයාගැනීම් බහුතරයක් සැලකිල්ලට ගන්නා ලදී. මෙම මොඩියුලය මූලික වශයෙන් අදහස් කරන්නේ ප්‍රධාන පුහුණුකරුගේ දැනුම, දැනුවත්භාවය, විශ්ලේෂණ කුසලතා සහ ඉගෙනුම් උපයෝගි කර ගැනීම වැඩිදියුණු කිරීම ය. කලාපීය මට්ටමින් පුද්ගලයින් පුහුණු කිරීමට සහ ඔවුන්ගේ අදාළ ප්‍රජාවන් තුළ උචිත දැනුවත් මැදිහත්වීම් කිරීමට මෙම මොඩියුල සහාය වනු ඇත. විශේෂිත කලාපීය ප්‍රජාවට ගැලපෙන ලෙස මැදිහත්වීම් තිබීමේ වැදගත්කම ඉස්මතු කරන ලද පර්යේෂණ සොයා ගැනීම් වලින් එකකට ප්‍රතිචාර වශයෙන්, ප්‍රධාන පුහුණුකරුවන්ට වැඩි අභිමතයක් ලබාදීම සඳහා මොඩියුලය සැලසුම් කරන ලද බව සටහන් කිරීම ද වැදගත් වේ. මෙම ලේඛනයේ පළමු කොටස වෙනස පිළිබඳ න්‍යාය විස්තර කරයි. ඉන්පසුව, න්‍යාය පත්‍රය, සැසි සැලසුම්, සහ අවසාන කොට, පුහුණුව සඳහා අවශ්‍ය කරන මෙවලම් සහ ආධාරක ලේඛන අන්තර්ගත කර ඇති ඇමුණුම අඩංගු වේ.

# වෙනස පිළිබඳ න්‍යාය

වැඩමුළු මාලාවට සහභාගිවීමේ සහ මෙම මොඩියුල සම්පූර්ණ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂා කරන විපර්වර්තනය මෙම අවස්ථාවේදී වෙනස පිළිබඳ න්‍යාය මගින් සිතියම් ගත කරයි. එය ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශයෙහි ස්වභාවය පිළිබඳව ධාරිතාව වැඩිකිරීමේ සහ දැනුවත්භාවය ඇති කිරීමේ අවශ්‍යතාව නියෝජනය කරයි. වෙනස පිළිබඳ න්‍යාය සඳහා බොහෝ දුරට පෙළඹවීම් කර එය පැන නැඟී ඇත්තේ මෙම මුලපිරීමේ කොටසක් ලෙස සිදු කරන ලද පර්යේෂණය මඟින් හඳුනාගත් හිඩැස් සහ අවශ්‍යතා මගින් ය. වෙනස පිළිබඳ න්‍යායට අනුව, සහභාගිවන්නන් මූලික සංකල්ප පිළිබඳ දැනුම, නෛතික දැනුම, සහ වර්තමාන ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශයේ ස්වභාවය පිළිබඳ අවබෝධය ලබාගැනීමෙන් ප්‍රජා අවකාශය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගනී. මෙම පුහුණුවට සහභාගිවීමෙන් පසු, පවතින/තිබිය හැකි සමාජ ව්‍යාපාරයකට මැදිහත් වීමට තීරණාත්මක හැකියාවන් මෙන්ම, පුළුල් මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා සහභාගිවන්නන් සන්නද්ධ වනු ඇතැයි මෙම පුහුණුව පූර්වාපේක්ෂා කරයි. මෙම පුහුණුවෙහි අවසාන අභිමතාර්ථය වනුයේ ප්‍රාදේශීය සමාජ ව්‍යාපාරයක සාර්ථකත්වයට මැදිහත් වීම හරහා ධනාත්මකව දායක වීමට අවශ්‍ය සංකල්‍ය දැනුම සහිත ප්‍රධාන පුහුණුකරුවන් සූදානම් කිරීම ය.

- පියවර 1 — ■ ප්‍රජා අවකාශය තුළ සහභාගිවීමට අවශ්‍ය මූලික සංකල්ප පිළිබඳ දැනුම ලබාගැනීම
- පියවර 2 — ■ප්‍රජා අවකාශය තුළ සහභාගිවීමට අවශ්‍ය කරන නෛතික දැනුම ලබාගැනීම
- පියවර 3 — ■ වර්තමාන ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශයේ ස්වභාවය ගැන ඉගෙනුම
- පියවර 4 — ■ මැදිහත්වීමකට පෙර සමාජ ව්‍යාපාරයක්/ඉදිරියේදී තිබිය හැකි සමාජ ව්‍යාපාරයක් විශ්ලේෂණය කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම
- පියවර 5 — ■ තෝරාගත් සමාජ ව්‍යාපාරයක්/ඉදිරියේ දී තිබිය හැකි සමාජ ව්‍යාපාරයක් සඳහා මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීමට දැනුම ලබා ගැනීම
- පියවර 6 — ■ විශේෂිත සමාජ ව්‍යාපාරයක මැදිහත් වීමට ප්‍රධාන පුහුණුකරුවෝ සූදානම්ව සිටිති

# න්‍යාය පත්‍රය

| | | |
|---|---|---|
| 01 වැනි දිනය | | |
| 01 | වැඩසටහනට පෙර  ඇගයීම | මිනිත්තු  තිහයි |
| 02 | හැඳින්වීම | මිනිත්තු  හැටයි |
| | **තේ විවේකය** | මිනිත්තු පහළොවයි |
| 03 | 01 වන සැසිය<br>සැසියේ මාතෘකාව: මූලික සංකල්ප පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන්ගේ දැනුවත්භාවය වැඩි කිරීම | මිනිත්තු එකසිය පහයි |
| | දිවා ආහාරය | මිනිත්තු  හැටයි |
| | 1 වන සැසිය<br>සැසියේ මාතෘකාව: මූලික සංකල්ප පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන්ගේ දැනුවත්භාවය වැඩි කිරීම | මිනිත්තු  එකසිය පනහයි |
| | තේ විවේකය | මිනිත්තු පහළොවයි |
| 04 | 02 වන සැසිය<br>සැසියේ මාතෘකාව: සමාගමයේ  නිදහසෙහි නෛතික පසුබිම පිළිබඳව දැනුවත්භාවය වැඩි කිරීම | මිනිත්තු  එකසිය විස්සයි |
| | 1 වැනි දින පිළිබඳව පුනරාවර්ජනය සහ මෙනෙහි කිරීම් | මිනිත්තු පහළොවයි |
| 02 වැනි දිනය | | |
| 05 | 03 වන සැසිය<br>සැසියේ මාතෘකාව: ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශයෙහි තත්ත්වය අවබෝධ කර ගැනීම | මිනිත්තු  අනූවයි |
| | තේ විවේකය | මිනිත්තු පහළොවයි |
| | 03 වන සැසිය<br>සැසියේ මාතෘකාව: ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශයෙහි තත්ත්වය අවබෝධ කර ගැනීම | මිනිත්තු එකසිය පහයි |
| | දිවා ආහාරය | මිනිත්තු  හැටයි |
| 06 | 04  වන සැසිය<br>සැසියේ මාතෘකාව: මැදිහත් වන ප්‍රජාව තුළ ගතිකයන් අවබෝධ කර ගැනීම සඳහා විශ්ලේෂණ මෙවලමක් හඳුන්වාදීම | මිනිත්තු  එකසිය පනහයි |
| | තේ විවේකය | මිනිත්තු  තිහයි |
| | 04  වන සැසිය | මිනිත්තු  එකසිය පනහයි |

| | | |
|---|---|---|
| | සැසියේ මාතෘකාව: මැදිහත් වන ප්‍රජාව තුළ ගතිකයන් අවබෝධ කර ගැනීම සඳහා විශ්ලේෂණ මෙවලමක් හඳුන්වාදීම | |
| | 2 වැනි දින පිළිබඳව පුනරාවර්ජනය හා මෙනෙහි කිරීම | මිනිත්තු තිහයි |
| 03 වන දිනය | | |
| 07 | 05 වන සැසිය<br>සැසියේ මාතෘකාව: මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම පිළිබඳ පුහුණුව | මිනිත්තු අනූවයි |
| | තේ විවේකය | මිනිත්තු පහළොවයි |
| | 05 වන සැසිය<br>සැසියේ මාතෘකාව: මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම පිළිබඳ පුහුණුව | මිනිත්තු එකසිය තිස්පහයි |
| 08 | පශ්චාත්-වැඩසටහන් ඇගයීම | මිනිත්තු තිහයි |
| | 3 වන දිනය පිළිබඳ පුනරාවර්ජනය සහ මෙනෙහි කිරීම සහ වැඩසටහන නිමා කිරීම | මිනිත්තු තිහයි |

# 01 වන සැසිය

**සැසියෙහි මාතෘකාව: මූලික සංකල්ප පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන්ගේ දැනුවත්භාවය වැඩි කිරීම**

| | |
|---|---|
| **විස්තරය** | මෙම වැඩමුළු සැසිය ඉදිරි ව්‍යාපෘති කාල සීමාව අතරතුර ප්‍රධාන පුහුණුකරුවන්ගේ අවධානය යොමු කරන ලබන මූලික සංකල්ප තුනක් පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබාදීමට අපේක්ෂා කරයි. මෙම සංකල්ප තුන වනුයේ ප්‍රජා අවකාශය, පුරවැසිභාවය, සහ සිවිල් සමාජ සංවිධාන යන මේවා ය.<br><br>1. *ප්‍රජා අවකාශය* යන මාතෘකාව යටතේ, ප්‍රථමයෙන් පුරවැසිභාවය සහ සිවිල් සමාජය තුළ සහභාගිත්වයෙහි වැදගත්කම හඳුන්වා දීම තීරණාත්මක වේ.<br><br>ඉන් අනතුරුව, සහභාගිත්වය පිළිබඳ සාකච්ඡාව තුළ පුරවැසිභාවය සහ සිවිල් සමාජය යන සංකල්ප ගැඹුරින් අධ්‍යයනය කළ යුතු ය.<br><br>2. *පුරවැසිභාවය* මෑත කාලයේ දේශපාලන වර්ධනයන්ගෙන් උදාහරණ භාවිතා කරමින්, අයිතීන් සහ වගකීම් යන දෘෂ්ටිකෝණ දෙකෙන්ම සාකච්ඡා කළ යුතුය.<br>3. *සිවිල් සමාජ සංවිධාන* යන සංකල්පය යටතේ, සිවිල් සමාජ සංවිධාන යන්නෙහි අර්ථය සහ අපේ සමාජයේ දේශපාලන වෙනසක් ඇති කිරීමේදී මහජන ක්ෂෙත්‍රයෙහි කාර්යභාරය අවබෝධ කර ගැනීමට සහභාගිවන්නන් හට සහායවීම තීරණාත්මක වේ.<br><br>සිවිල් සමාජ සංවිධාන දේශපාලන පක්ෂ සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කිරීම තීරණාත්මක වේ.<br><br>මෙම සංකල්ප ගැන අවබෝධයක් ලබා ගැනීම ප්‍රධාන පුහුණුකරුවන්ට අනාගතයේදී වඩා අර්ථවත් ක්‍රියාකාරකම් සහ මැදිහත්වීම් වල නිරත වීමට හැකියාව ලබාදෙනු ඇත. |
| **අරමුණ** | මූලික සංකල්ප පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන්ගේ දැනුවත්භාවය සහ අවබෝධය ඉහළ නැංවීම සහ එම සංකල්ප සමඟ විවේචනාත්මකව සම්බන්ධවීමට ඔවුන්ට සහාය වීම. |
| **මුළු කාල සීමාව** | පැය 3 යි විනාඩි 15 කි |
| **සම්බන්ධවීමේ ක්‍රමවේදය** | 1. ප්‍රජා අවකාශය - ඉදිරිපත් කිරීම<br>2. පුරවැසිභාවය - ක්‍රියාකාරකම හා සාකච්ඡාව<br>3. සිවිල් සමාජය - ක්‍රියාකාරකම හා සාකච්ඡාව |
| **ආධාරක** | ○ ෆ්ලිප් චාර්ට්/වයිට් බෝඩ්<br>○ මාකර් පෑන්<br>○ A4/A3 කඩදාසි<br>○ පෑන්<br>○ ලැප්ටොප් පරිගණකය |
| **පියවර** | **ප්‍රජා අවකාශය පිළිබඳ ඉදිරිපත් කිරීම (විනාඩි 15 කි)**<br><br>➢ **ප්‍රජා අවකාශයෙහි සංකල්පය සහ එහි සංරචක පිළිබඳව පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම (විනාඩි 15 කි)**<br><br>**පුරවැසිභාවය පිළිබඳ සාකච්ඡාව (පැය 1 යි විනාඩි 30 කි)** |

- **සූදානම (විනාඩි 5 කි)**

  - ජනවාර්ගිකත්වය මත පදනම්ව කණ්ඩායම් 8 කට බෙදන්න

- **ක්‍රියාවලිය (විනාඩි 40 කි)**

  - එක් එක් කණ්ඩායමට කොලයක් සහ පෑනක් ලබාදෙන්න.
  - "පුරවැසිභාවය" යන වචනය ඇසෙන විට ඔවුන්ගේ සිතට එන දේ ලියන ලෙස පවසන්න. අවශ්‍ය කරන්නේ සෛද්ධාන්තික පැහැදිලි කිරීමක් නොව, එම වචනය ඇසෙන විට ඔවුන්ගේ සිතට එන වචන ලිවීම පමණක් බව පවසන්න.
  - කණ්ඩායම් සාමාජිකයින් විසින් එකතු කරන ලද වචන ලැයිස්තුව ඉදිරිපත් කිරීමට කණ්ඩායමේ එක් සාමාජිකයෙකුට පවරන්න.
  - ජනවාර්ගික කණ්ඩායම් හරහා සංසන්දනය කළ හැකිවන පරිදි, සම්පත්දායකයා විසින් එක් එක් කණ්ඩායම විසින් එකතු කරන ලද වචන ෆ්ලිප් චාර්ට් එක මත ලිවිය යුතු ය.

**පසුවිමසුම් කිරීම (විනාඩි 45 යි)**

  - දෙන ලද පිළිතුරු සම්පත්දායකයෙකු විසින් විශ්ලේෂණය කරනු ලැබේ. ජනවාර්ගික කණ්ඩායම මත පදනම්ව පිළිතුරු වෙනස් විය හැක. එය වෙනස් නම්, එම පිළිතුරු වෙනස් වන්නේ මන්ද යන්න ගැන කතා කරන්න. ශ්‍රී ලංකාවේ රාජ්‍යය- සමාජය සම්බන්ධතාව ගැන අවබෝධ කර ගැනීමේදී මෙම වෙනස්කම් වල ගම්‍යාර්ථයන් සාකච්ඡා කරන්න.
  - කණ්ඩායම් විසින් දෙන ලද පිළිතුරු මත පදනම්ව, පුරවැසි අයිතීන් සහ වගකීම් අතර ඇති වෙනස්කම්, සහ මේ දෙකම එක හා සමානව වැදගත් වන්නේ කෙසේද සහ මන්ද යන්න පිළිබඳව සම්පත්දායකයා සාකච්ඡා කරයි. මෑතකාලීන සිදුවීම් කිහිපයක් සැලකිල්ලට ගෙන මෙය සාකච්ඡා කළ හැකිය (යොමුව: ඇමුණුම 01)

**සිවිල් සමාජය ගැන සාකච්ඡාව (පැය 1 යි විනාඩි 30 කි)**

- **සූදානම (විනාඩි 5 යි)**
  - සහභාගිවන්නන් අහඹු ලෙස කණ්ඩායම් 4 කට බෙදන්න

- **ක්‍රියාවලිය (විනාඩි 40 කි)**
  - කඩදාසි හතරක් මත, සිවිල් සමාජ සංවිධාන වල කාර්යයන් පිළිබඳව පහත සඳහන් ස්ථාවර දෙක ලියන්න. එක් එක් ස්ථාවරය කොල දෙකක ලිවිය යුතුය.
    1 වන ස්ථාවරය - "සිවිල් සමාජ සංවිධාන දේශපාලන පක්ෂ සමඟ සහයෝගයෙන් කටයුතු නොකළ යුතු ය."
    2 වන ස්ථාවරය - "සිවිල් සමාජ සංවිධාන වලට දේශපාලන පක්ෂ සමඟ සහයෝගයෙන් කටයුතු කළ හැකිය."
  - සෑම කණ්ඩායමෙන්ම එක් නියෝජිතයෙකුට පැමිණ එක් කොලයක් අහඹු ලෙස තෝරා ගන්නා ලෙස ආරාධනා කරන්න.
  - සෑම කණ්ඩායමකටම ඔවුන්ට ලැබී ඇති ස්ථාවරය තහවුරු කිරීම සඳහා සාකච්ඡා කර කරුණු 5 ක් ලියන ලෙස ඉල්ලා සිටින්න.
  - ඔවුන්ගේ සොයාගැනීම් ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකින්ම එක් නියෝජිතයෙකුට ආරාධනා කරන්න.
  - සම්පත්දායකයා ලවා ෆ්ලිප් චාර්ට් එක මත කරුණු සටහන් කරගන්න.

| | |
|---|---|
| | ➢ **පසුවිමසුම් කිරීම (විනාඩි 45 යි)**<br>○ සම්පත්දායකයා ප්‍රතිචාර විශ්ලේෂණය කර සිවිල් සමාජය පිළිබඳ සංකල්පය සහ ශ්‍රී ලංකාව තුළ දේශපාලනික විපර්වර්තනය තුළ එහි කාර්යභාරය පිළිබඳව සහභාගිවන්නන් දැනුවත් කරනු ඇත. |

# 02 වැනි සැසිය

## සැසි මාතෘකාව: සමාගමයේ නිදහසෙහි නෛතික පසුබිම පිළිබඳව දැනුවත්භාවය වැඩි කිරීම

| | |
|---|---|
| **විස්තරය** | සමාගමයේ නිදහසෙහි නෛතික පදනම් පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන්ට දැනුම ලබාදීමට වැඩමුළුවෙහි මෙම සැසිය සැලසුම් කර ඇත. තමන්ගේ අදාළ ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාපාර මුහුණ දෙන විවිධ අභියෝග වලට මුහුණ දීම සඳහා ප්‍රධාන පුහුණුකරුවන් විසින් පුහුණු කරන ප්‍රජාවන්ට මෙම දැනුම විශේෂයෙන් ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රජාවන්ට තම සමාගමයේ නිදහසට බාධා කළ හැකි හෝ සීමා කළ හැකි තත්ත්වයන් පිළිබඳව දැනුවත් වීමෙන් ප්‍රයෝජන ලැබෙනු ඇත. අවසාන කොට, ප්‍රධාන පුහුණුකරුවන් විසින් ප්‍රජාවන්ට ලබාදෙන දැනුම බිම් මට්ටමේ සමාජ ව්‍යාපාර වලට සුමටව ක්‍රියාත්මක වීමට උපකාරී වනු ඇත. |
| **අරමුණ** | ප්‍රධාන පුහුණුකරුවන් හරහා සමාගමයේ නිදහසෙහි නෛතික පදනම් පිළිබඳව ප්‍රාදේශීය ප්‍රජාවේ දැනුවත්භාවය ඉහළ නැංවීම. |
| **මුළු කාල සීමාව** | පැය 2 කි |
| **සම්බන්ධවීමේ ක්‍රමවේදය** | සිදුවීම් විශ්ලේෂණය |
| **ආධාරක** | ○ ෆ්ලිප් චාර්ට්/වයිට් බෝඩ්<br>○ මාකර් පෑන්<br>○ A4 කඩදාසි<br>○ පෑන් |
| **පියවර** | ➢ **සූදානම්වීම (විනාඩි 5 කි)**<br>○ සහභාගිවන්නන් කණ්ඩායම් හතරකට බෙදන්න.<br>○ සමාගමයේ නිදහස ප්‍රබලව සාකච්ඡාවට ලක් වූ/විවාදයට ලක් වූ, ශ්‍රී ලංකාවේ මෑතකාලීන සිදුවීම් විදහා දක්වන වීඩියෝ පට හතරක් ලබාදෙන්න (යොමුව: ඇමුණුම 02)<br><br>➢ **ක්‍රියාවලිය (විනාඩි 55 කි)**<br>○ එක් එක් කණ්ඩායමට කොලයක් හා පෑනක් ලබාදෙන්න<br>○ එක් එක් කණ්ඩායමට වීඩියෝ පටයක් බැගින් ලබා දී සමාගමයේ නිදහස උල්ලංඝනය වී ඇති ආකාරය සහ පුරවැසියන් එය අවභාවිතා කර ඇති ආකාරය පිළිබඳ අවස්ථා දැකීම පිණිස එය නැරඹීම.<br>○ කණ්ඩායමේ එක් සාමාජිකයෙකුට වීඩියෝව සෙසු සාමාජිකයන්ට පෙන්වන ලෙස පවසා, ඔවුන් සාකච්ඡා කළ දේ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින්න.<br>○ ඔවුන් මතු කළ නිරීක්ෂණ/ගැටළු සම්පත්දායකයා විසින් ෆ්ලිප් චාර්ට් එක මත ලිවීමට සලස්වන්න.<br><br>➢ **පසුවිමසුම් කිරීම (පැය 1 කි)**<br>○ සම්පත්දායකයා කණ්ඩායම් විසින් සඳහන් කරන ලද කරුණු සලකා බලා, සමාගමයේ නිදහස සහතික කිරීමට ශ්‍රී ලංකාවේ පවතින නෛතික ප්‍රතිපාදන හා එය සීමා විය හැකි අවස්ථා සාකච්ඡා කරයි.<br>○ මේ අවස්ථාවේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA), සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) සහ වෙනත් අදාළ නීති පිළිබඳව ද සම්පත්දායකයාට සාකච්ඡා කළ හැකිය. |

# 03 වන සැසිය

## සැසියෙහි මාතෘකාව: ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශයෙහි තත්ත්වය අවබෝධ කර ගැනීම

| | |
|---|---|
| විස්තරය | මෙම ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස සිදු කරන ලද පර්යේෂණය මත පදනම්ව මෙම සැසිය පවත්වනු ඇත. මෙම මුලපිරීමේ කොටසක් ලෙස සිදු කළ පර්යේෂණය, මෙම ව්‍යාපෘතියට අවශ්‍ය මඟපෙන්වීම දෙනු ඇතැයි අපේක්ෂා කරන ලදී. මෙම අධ්‍යයනය ප්‍රජා අවකාශයන් තුළ පුරවැසි සහභාගිත්වයේ සහ සමාගමයේ නිදහසෙහි ස්වභාවය පිළිබඳව හෙළිදරව් කරන ලදී. මෙම සැසිය තුළ, පර්යේෂණයේ සොයාගැනීම් සහ නිර්දේශ ඉදිරිපත් කරනු ඇත. තවද සොයාගැනීම් සහ නිර්දේශ පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන්ගේ ප්‍රතිපෝෂණය ලබාගැනීම සඳහා ඔවුන් සමඟ සාකච්ඡාවක් පැවැත්වෙනු ඇතැයි ද පූර්වාපේක්ෂා කෙරේ. මෙම දැනුම, වැඩමුළුවේ පසුව එන සැසි වලදී සමාජ ව්‍යාපාරයක් විශ්ලේෂණය කිරීමට සහ මැදිහත් වීමේ සැලසුම් යෝජනා කිරීමට ඔවුන්ට උපකාර වනු ඇත. අවසාන කොට, ප්‍රාදේශීය ප්‍රජාවන් තුළ දැනුවත් මැදිහත්වීමක් සිදු කිරීම සඳහා මෙම දැනුම අවශ්‍ය වනු ඇත. |
| අරමුණ | ප්‍රධාන පුහුණුකරුවන් බිම් මට්ටමේ ප්‍රජා අවකාශයෙහි ස්වභාවය හා කාර්යය පිළිබඳව ඉගෙනුම ලබා පර්යේෂණයෙහි සොයාගැනීම් සමඟ අන්තර්ක්‍රියා කරනු ඇත. |
| පූර්ණ කාල සීමාව | පැය 3 යි විනාඩි 15 කි |
| සම්බන්ධ වීමේ ක්‍රමවේදය | ඉදිරිපත් කිරීම සහ සාකච්ඡාව |
| ආධාරක | • ෆ්ලිප් චාර්ට්/වයිට් බෝඩ්<br>• මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරය<br>• ලැප්ටොප් පරිගණකය<br>• මාකර් පෑන් |
| පියවර | ➢ **ඉදිරිපත් කිරීම (පැය 2 යි විනාඩි 30 කි)**<br>○ පර්යේෂණ කණ්ඩායමේ සොයාගැනීම් පිළිබඳ ඉදිරිපත් කිරීම<br>➢ **සාකච්ඡාව (විනාඩි 45 කි)**<br>○ සොයාගැනීම් පිළිබඳ සාකච්ඡාව |

# 04 වන සැසිය

## සැසියේ මාතෘකාව: මැදිහත්වීම් සිදු කරන ප්‍රජාවේ ගතිකයන් අවබෝධ කර ගැනීම සඳහා විශ්ලේෂණ මෙවලමක් හඳුන්වාදීම

| | |
|---|---|
| **විස්තරය** | මෙම සැසිය තුළ, පර්යේෂණයේ සොයාගැනීම් මත පදනම්ව සකස් කරන ලද විශ්ලේෂණ මෙවලමක් පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කරනු ලැබේ. මෙම විශ්ලේෂණ මෙවලම දෙන ලද ප්‍රජාවක සන්දර්භය විශ්ලේෂණය කිරීමට භාවිතා කරනු ඇත. මෙම ව්‍යාපෘතියේ කොටසක් ලෙස සිදුකරන ලද පර්යේෂණයෙහි සොයාගැනීම් වලට අනුව, ජනතාවගේ සහභාගිත්වයේ සහ සමාගමයේ නිදහසෙහි වෙනස් වන ස්වභාවය සැලකිල්ලට ගනිමින්, එක් එක් ස්ථානය සඳහා ගැලපෙන ප්‍රවේශයක් තිබීම ඉතා වැදගත් වේ. මෙම මෙවලම ප්‍රධාන පුහුණුකරුවන් හට, හඳුනාගත් ප්‍රජාවේ ගැටලු වල විෂය පථය හා ගැඹුර අවබෝධ කර ගැනීමට මෙන්ම, හඳුනාගත් ප්‍රජාවේ ගැටලුවට සෘජුව හා වක්‍රව සම්බන්ධ වන පාර්ශවකරුවන් තක්සේරු කිරීමට උපකාර වනු ඇත. තවද, මෙම මෙවලම, විසඳුමක් කරා ළඟාවීම සඳහා ඇති හැකියාවන් විශ්ලේෂණය කිරීමට, විසඳුම් සෙවීමේ ඔවුන්ගේ අරගලය තුළ ඔවුන් මුහුණ දෙනු ලබන අභියෝගයන්, කුසලතා, දැනුවත්භාවය, සහ අවබෝධයන් වර්ධනය කර ගැනීමට තෙවන පාර්ශවයක සහයෝගය අවශ්‍ය කරන ක්ෂේත්‍රයන්, ප්‍රජා සහභාගිත්වයෙහි ස්වභාවය සහ සහභාගිවීමට පුරවැසියන් සඳහා ඇති අවකාශය, යනාදිය විශ්ලේෂණය කිරීමට ඔවුන්ට ඉඩ සලසයි. මෙම විශ්ලේෂණය ඔවුන්ගේ මැදිහත්වීමේ ක්‍රමෝපායය සකස් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. දී ඇති සන්දර්භයක විෂය පථය තක්සේරු කිරීම සඳහා තොරතුරු සහ ඉඟි සපයන ආදර්ශ කතාන්දරයක් මෙම සැසිය තුළ දී ප්‍රධාන පුහුණුකරුවන් වෙත ලබාදෙනු ඇත. දී ඇති ආදර්ශ කතාන්දරයට විශ්ලේෂණ මෙවලම උපයෝගී කිරීම මගින් ඔවුන්ව පුහුණු කරනු ලබන ප්‍රායෝගික සැසියකට සහභාගි වන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටිනු ඇත. |
| **අරමුණ** | මැදිහත්වීම් කරනු ලබන ප්‍රජාවක ගතිකයන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා, විශ්ලේෂණ මෙවලම භාවිතා කරන ආකාරය ගැන ප්‍රධාන පුහුණුකරුවන් පුහුණුව ලබති. |
| **මුළු කාල සීමාව** | පැය 3 යි |
| **සම්බන්ධවීමේ ක්‍රමවේදය** | ඉදිරිපත් කිරීම සහ ක්‍රියාකාරකම |
| **ආධාරක** | • ෆ්ලිප් චාර්ට්/වයිට් බෝඩ්<br>• මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරය<br>• ලැප්ටොප් පරිගණකය<br>• මාකර් පෑන්<br>• විශ්ලේෂණ මෙවලමෙහි මුද්‍රිත පත්‍රිකාවක් (යොමුව: ඇමුණුම 03)<br>• ආදර්ශ කතාන්දරයෙහි මුද්‍රිත පත්‍රිකාවක් (යොමුව: ඇමුණුම 04) |
| **පියවර** | ➢ **සූදානම් වීම (විනාඩි 10 යි)**<br>○ කණ්ඩායම් 8 ක් සෑදීම<br>○ සහභාගිවන්නන් හට විශ්ලේෂණ මෙවලමෙහි හා ආදර්ශ කතාන්දරයෙහි මුද්‍රිත පත්‍රිකා ලබාදීම<br><br>➢ **ක්‍රියාවලිය (පැය 2 යි විනාඩි 20 යි)**<br>○ විශ්ලේෂණ මෙවලමෙහි අන්තර්ගතය පැහැදිලි කරන්න.<br>○ සම්පත්දායකයාට තමන්ට හුරු පුරුදු සමාජ ව්‍යාපාරයක සිද්ධි අධ්‍යයනයකට විශ්ලේෂණ මෙවලම යොදා ගැනීම ද (උපයෝගී කර ගැනීම) කළ හැකිය.<br>○ ලබා දී ඇති ආදර්ශ කතාන්දරය කියවන ලෙස ප්‍රධාන පුහුණුකරුවන්ගෙන් ඉල්ලා සිටින්න.<br>○ පසුව, ආදර්ශ කතාන්දරය ගැන සිදු කළ ඔවුන්ගේ විශ්ලේෂණය ඉදිරිපත් කරන ලෙස එක් එක් කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න. |

| | |
|---|---|
| | ➢ **සාකච්ඡාව (විනාඩි 30 කි)**<br>○ සම්පත්දායකයා ඉදිරිපත් කිරීම් පිළිබඳ අදහස් දක්වයි.<br>○ කණ්ඩායම් වලට තම තමන්ගේ ආදර්ශ කතාන්දර විශ්ලේෂණය ඊළඟ සැසියට රැගෙන එන ලෙස ඉල්ලා සිටින්න, එම සැසිය ඊළඟ දිනයේදී පැවැත්වේ. |

# 05 වන සැසිය

## සැසියේ මාතෘකාව: මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම පිළිබඳ පුහුණුව

| | |
|---|---|
| විස්තරය | වැඩමුළුවෙහි මෙම අවසාන සැසිය තුළ, ප්‍රධාන පුහුණුකරුවන් සමාජ ව්‍යාපාරයක් සඳහා මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීමට හැකියාව ලබාගනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සැසිය තුළ දී, 4 වන සැසියේ දී මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා ඉදිරිපත් කළ ආදර්ශ කතාන්දරයම භාවිතා කරනු ඇත. මෙම අභ්‍යාසය ව්‍යාපෘති කාල සීමාව අතරතුර නිශ්චිත ප්‍රජාවක් සඳහා තමන්ගේම මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා අවශ්‍ය කරන දැනුම සහ පුරුද්ද ඔවුන්ට ලබා දෙනු ඇත. මෙම පුහුණුව හරහා, විසඳුමක් සොයාගැනීම සඳහා මහජන සහභාගිත්වය වැඩි කිරීමට ගත යුතු පියවර යෝජනා කිරීමට, සමාගමයේ නිදහස සුරක්ෂිත වන බව සහතික කිරීමට යෝජනා, සහ තමන්ගේ හැකියාවෙන් දේශපාලනික විපර්වර්තනයට දායක වීම සඳහා දැනුවත් ආකාරයකින් සහභාගිවීමට ජනතාව සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රධාන පුහුණුකරුවන්ට හැකිවිය යුතු ය. මෙම මැදිහත්වීමේ සැලැස්ම ව්‍යාපෘති කාල සීමාව පුරාවට තෝරාගත් සමාජ ව්‍යාපාරය සඳහා ව්‍යාපෘතියේ සෑම අදියරකදීම මඟපෙන්වීම ලබාදෙන මාර්ග සිතියමක් ලෙස ක්‍රියා කරනු ඇත. |
| අරමුණ | නිශ්චිත ප්‍රජාවක් සඳහා මැදිහත්වීමේ ක්‍රමෝපායයන් සැකසීමට ප්‍රධාන පුහුණුකරුවන්ට හැකි වනු ඇත |
| මුළු කාල සීමාව | පැය 2 යි විනාඩි 45 කි |
| සම්බන්ධ වීමේ ක්‍රමවේදය | ක්‍රියාකාරකම සහ සාකච්ඡාව |
| ආධාරක | • ෆ්ලිප් චාර්ට්/වයිට් බෝඩ්<br>• මාකර් පෑන්<br>• ආදර්ශ කතාන්දරයෙහි මුද්‍රිත පත්‍රිකා<br>• මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශයෙහි මුද්‍රිත පත්‍රිකා |
| පියවර | ➢ **සූදානම්වීම (විනාඩි 15 කි)**<br>○ 4 වන සැසිය අතරතුර තමාට වෙන් කර දුන් කණ්ඩායම සමඟ අසුන් ගන්නා ලෙස සහභාගිවන්නන්ට පවසන්න<br>○ එක් එක් කණ්ඩායමට ආදර්ශ කතාන්දරයේ මුද්‍රිත පිටපතක් ලබා දෙන්න<br>○ මැදිහත්වීමේ සැලැස්ම සකස් කිරීම සඳහා එක් එක් කණ්ඩායමට මාර්ගෝපදේශ පත්‍රිකාවෙහි මුද්‍රිත පිටපතක් ලබාදෙන්න<br><br>➢ **ක්‍රියාවලිය (පැය 2 කි)**<br>○ ආදර්ශ කතාන්දරය කියවන ලෙස කණ්ඩායම් වලින් ඉල්ලා සිටින්න<br>○ මැදිහත්වීමේ සැලැස්මක් සකසන ලෙස කණ්ඩායම් වලින් ඉල්ලා සිටින්න<br>○ තමන්ගේ මැදිහත්වීමේ සැලැස්ම ඉදිරිපත් කරන ලෙස කණ්ඩායමේ එක් සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න<br>○ මැදිහත්වීමේ සැලැස්මෙහි ධනාත්මක සහ සෘණාත්මක කරුණු සම්පත්දායකයා විසින් ලියා තබනු ඇත<br><br>➢ **පසුවිමසුම් කිරීම (විනාඩි 30 කි)**<br>○ ඉදිරිපත් කිරීම පිළිබඳ ඔවුන්ගේ ප්‍රතිපෝෂණ සම්පත්දායකයා විසින් බෙදාහදා ගනු ඇත |

| | |
|---|---|
| | ○ කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද සැලසුම් මත පදනම්ව, ජාතික සාම මණ්ඩලයේ අදාළ නිලධාරීන් විසින් ව්‍යාපෘතියේ කොටසක් ලෙස යථාර්ථවාදීව කළ හැකි කුමක්ද සහ කළ නොහැකි කුමක්ද යන්න පිළිබඳව ප්‍රතිපෝෂණ ලබා දෙනු ඇත |

# ඇමුණුම්

## ඇමුණුම 01: පුරවැසිභාවය පිළිබඳ සිද්ධි අධ්‍යයන

**දෙනියාය - ලංකාගම මාර්ගය**

පවුල් 180 ක් පමණ ජීවත්වන සිංහරාජ ජාතික උරුම වන භූමිය ආසන්නයේ පිහිටි ලංකාගම දක්වා මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස සිදු කළ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් වනාන්තර තුළින් විහිදී ඇති මාර්ගය සංවර්ධනය කිරීමට අනුමැතිය දෙන ලදි. මෙම මාර්ගය නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මාදුගැටේ, වාරුකන්දෙණිය හා ලංකාගම යන ග්‍රාමනිලධාරී වසම් තුන ඔස්සේ කිලෝමීටර 18 ක් පමණ දිග අඩි 15 ක් පමණ පළල මාර්ගයක් ලෙස සංවර්ධනට කටයුතු කරයි .නමුත් සිංහරාජ ලෝක උරුම සංවේදී කලාපය මැදින් වැටී ඇති මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමෙන් විශාල පරිසර හානියක් සිදුවන බවත් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් (ඊෂ්) හෝ විද්‍යාත්මක සහ තාක්ෂණික මෙවලම් (ඹදදකි) භාවිත නොකර ලංකාගම-නෙළුව මාර්ගය සංවර්ධනය කිරීම නිසා පරිසර හානියට අමතරව මහජන මුදල් ද අපතේ ගොස් ඇති බවට පරිසරවේදීහු චෝදනා කරනු ලැබිය . ලෝක උරුම සම්මුතිය ක්‍රියාවට නැංවීම සඳහා වන මෙහෙයුම්වලට අදාළ මාර්ගෝපදේශ (ධවැරේඑසදබ්ක ඨමසාැකසඛ්‍ෑ) අනුව ලෝක උරුමයක් වන සිංහරාජය හරහා මෙවැනි ව්‍යාපෘතියක් සිදු කළ නොහැකි බව දක්වමින් යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව සහ යුනෙස්කෝ සංවිධානය වාර්ථා කැදවනු ලැබිය . කෙසේ වෙතත් තාවකාලිකව අත්හිටවනු ලැබූ මෙම ව්‍යාපෘතිය ලංකාගම ජනතාව විසින් සිදු කළ ඉල්ලීම් සළකා නැවත ආරම්භ කරන ලදි .

**ගුරු විදුහල්පති වැඩවර්ජනය**

ගුරු - විදුහල්පති වැටුප් විෂමතාවය , අධ්‍යාපනයට 6 % වෙන් කිරීම , පාසල් නඩත්තුවට දෙමාපියන්ගෙන් ගාස්තු අයකිරීම නැවැත්වීම ඇතුලු ඉල්ලීම් කිහිපයක් මුල් කරගනිමින් ගුරුවරුන් සහ විදුහල්පතිවරු 2019 , 2020 වසරවලදී අවස්ථා කිහිපයක දී වැඩවර්ජන සිදුකරනු ලැබුහ . ආණ්ඩුව විසින් යහපත් ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් 2021 ජුලි 21 දින සිට ඔන්ලයින් අධ්‍යාපනය නවත්වා දමමින් අඛණ්ඩ වැඩවර්ජනයක් සිදු කෙරිණ . මේ වන විට කොරෝනා වසංගතය හේතුවෙන් පාසල් අධ්‍යපනය මාස කිහිපයක් නවතා දැමුණු නිසා මෙම වැඩවර්ජනය දරුවන්ගේ අධ්‍යාපනයට දැඩි බලපැමක් එල්ල කරන බවට ගුරුවරුන්ට විවේචන එල්ල විය .

**ශබ්ද විකාශන යන්ත්‍ර**

ශ්‍රී ලංකාවේ ආගමික ස්ථානවල තම ආගමික වතාවත් සිදු කිරීමට සහ ප්‍රචාරය කිරීමට ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සිදු වෙයි . නමුත් එමගින් සිදුවන ශබ්ද දූෂණය සහ මහජන පීඩාව පිළිබදව සළකා ආගමික

ස්ථාන පාසල්වල ඇති ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ඇතිකරන පීඩාව නවත්වන ලෙස 2023 / 01 /09 දින මානව හිමිකම් කොමිසම විසින් පොලිසියට නියොග කරනු ලැබුහ. ඒ ආගමක් ඇදහීමට ඇති අයිතිය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති බවට සහ ආගමික සංහිදියාව බිදවැටේ යැයි ඉදිරිපත් කළ තර්කය ද නොසළකා හරිමින් අනවශ්‍ය ශබ්ද විකාශන නවතා දැමීමට පොලිසියට බලය ඇති බව දැක්විය . ශබ්ද දුශණයට එරෙහි එකමුතුවේ ලේකම් ස්වර්ණමාලි අනුරාධනායක විසින් අනුරාධපුර පොලිසියට එරෙහිව මෙම පැමිණිල්ල සිදුකර තිබුණි .

**බදු ප්‍රතිපත්තිය**

රුපියල් ලක්ෂයට වඩා වැඩි මාසික ආදයම් ලබන පුද්ගලයින්ගේ ආදායම මත බදු අය කරන, දේශීය ආදායම් (සංශෝධන) පනත 13 ඔක්තෝබර් 2022 සිට බලාත්මක කර තිබේ. මෙම පනත යටතේ රුපියල් ලක්ෂයට වැඩි මාසික ආදයම මත 6% සිට 36% දක්වා බදු අය කිරීම 2023 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක කරනු ලැබිය . රජය ක්‍රියාත්මක කර ඇති නව බදු ක්‍රමයට විරෝධය දක්වමින් ලංකා ඛනිජ තෙල් වෘත්තිය සමිති එකමුතුව , මහබැංකු විධායක නිලධාරින්ගේ සංගමය,ජල සම්පාදන මණ්ඩලයේ සේවකයින් , රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඇතුලු වෘත්තිය සමිති විසින් විරෝධය දක්වන ලදි. එසේ ම මෙම බදු ප්‍රතිපත්තියට එරෙහිව වෘත්තියවේදීන්ගේ වෘත්තිය සමිති එකමුතුව "කළු සතිය" විරෝධතා සතිය ප්‍රකාශයට පත්කරන ලදි

## ඇමුණුම 02: සමාගමයේ නිදහස - වීඩියෝ සබැඳි

**වීඩියෝව** 01

https://www.youtube.com/watch?v=VmGyKo104l0



**වීඩියෝව 02**

https://youtu.be/5pOkKbNUEdQ




**වීඩියෝව 03**

https://youtu.be/Z65fRL1axak




**වීඩියෝව 04**

https://www.youtube.com/watch?v=RPZlXKOHezc&ab_channel=LANKALEADNEWS




**වීඩියෝව 05**

https://www.youtube.com/watch?v=QDhGBK6m8pM&ab_channel=NewsfirstSriLanka




**වීඩියෝව 06**

https://www.youtube.com/watch?v=iXtINwvMaks&ab_channel=LankaLive




**වීඩියෝව 07**

https://www.youtube.com/watch?v=VbgDF2bCcZY&ab_channel=NewsfirstSriLanka




### ඇමුණුම 03: විශ්ලේෂණ මෙවලම

- **ලබා දුන් ප්‍රජාවේ සමාජ පසුබිම තක්සේරු කිරීම.**

ප්‍රජාවේ සමාජ පසුබිම අවබෝධ කර ගැනීම මෙහිදී වැදගත් වේ. ඒ අනුව කොපමණ පිරිසක් ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කර සිටීද? කොපමණ පිරිසක් සාමාන්‍ය පෙළ සමත්ද? කොපමණ පිරිසක් උසස් පෙළ සමත් ද? සහ කොපමණ පිරිසක් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා ඇතිද ?

ලබා දී ඇති ප්‍රදේශයේ ආගමික ප්‍රජාවේ ව්‍යාප්තිය කෙසේද? සහ ප්‍රදේශයේ පවතින විවිධ කුලයන් හදුනා ගන්න. අදාළ ප්‍රජාවේ වාර්ගික සංයුතිය ඇතුළත් සිතියමක් අඳින්න.

- **ප්‍රජාවේ දේශපාලන පසුබිම**

දැනට පවතින දේශපාලන පක්ෂ මොනවාද? ප්‍රජාවෙහි පවතින දේශපාලන පක්ෂ සමග පවතින්නේ කුමනාකරයේ සම්බන්ධතාවයක්ද? සහ ප්‍රජාව එම පක්ෂ සමග සම්බන්ධ වීමේ ස්වභාවය කෙසේද?

- **ආර්ථික පසුබිම**

ප්‍රජාවේ කුමනාකාරයේ රැකියා සහ වෘත්තීන්වල නියැලෙන අය සිටීද ? පවුලක් විසින් ලබන සමාන්‍ය ආදායම් මට්ටම කුමක්ද ? ප්‍රජාවේ සමාජ - ආර්ථික තත්ත්වය සහ පන්ති ව්‍යාප්තිය කෙසේද ?

- **ගැටලුව කුමක්ද?**

ප්‍රජාවේ ගැටලුව හදුනාගෙන තේරුම් ගැනීම

- **මෙම ගැටලුව සමාජයේ විවිධ කොටස්වලට බලපා ඇත්තේ කෙසේද?**

හදුනා ගන්නා ලද ගැටලුව එම ප්‍රජාවේ පුද්ගලයන්ට / උප කණ්ඩායම්වලට බලපා ඇති ආකාරය විශ්ලේෂණය කර විස්තර කරන්න. මෙසේ විශ්ලේෂණය කිරීමේදී තරුණයන්,කාන්තාවන්, වාර්ගික කණ්ඩායම්,කුලය, ආගමික කණ්ඩායම්,රැකියාව, අධ්‍යාපනය යනාදී වශයෙන් සලකා බලන්න.

- **සමාජයේ විවිධ කොටස්වලින් බලාපොරොත්තු වන විසඳුම් මොනවාද?**

ප්‍රදේශයේ ඇති වී තිබෙන ගැටලුවෙන් බලපෑමට ලක් වන විවිධ කොටස් අපේක්ෂා කරන විසඳුම් මොනවාදැයි විශ්ලේෂණය කර එම විසඳුම් ලැයිතුගත කරන්න

- **ප්‍රදේශයේ පවතින ගැටලුව සම්බන්ධයෙන් දේශපාලන පක්ෂවල ස්ථාවරය කෙසේද?**

ගැටලුව සම්බන්ධයෙන් ප්‍රජාව සමග කටයුතු කරන දේශපාලන පක්ෂ විසින් සිදු කරන ක්‍රියා, අක්‍රියතා , කටයුතු තක්සේරු කරන්න

- **ගැටලුවට විසඳුම් සෙවීම සම්බන්ධයෙන් ප්‍රජාවේ සමාජ සහ දේශපාලන ජාලවල සාමාජිකයන් කවුරුන්ද?**

ගැටලුව සඳහා විසඳුම් ලබා ගැනීමට උදව් ලබා ගත හැකි ජාලයන් , සම්බන්ධතා සහ සමාජ ප්‍රාග්ධනයන් පිළිබද සැකැස්මක් සකසන්න/සිතියම්ගත කරන්න.

- **පවතින ප්‍රජා මූලික සංවිධාන/ සිවිල් සංවිධාන සහ මෙම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ ස්ථාවරයන්?**

ප්‍රදේශයේ පවතින ප්‍රජා මූලික සහ සිවිල් සංවිධාන මොනවාදැයි පරීක්ෂා කරන්න. ගැටලුව සඳහා ඔවුන්ගේ දායකත්වය, ඔවුන්ගේ විෂය පථය සහ ධාරිතාව පරීක්ෂා කරන්න.

- **ප්‍රජා නායකයින් සහ මෙම ගැටලුව පිළිබද ඔවුන්ගේ ස්ථාවරය ?**

ප්‍රදේශයේ සිටින ප්‍රජා නායකයන් සොයා ගන්න. ගැටලුව සම්බන්ධයන් ඔවුන්ගේ ක්‍රියාකාරී සහ අකමන්‍යතාවය මෙන්ම ඔවුන්ගේ මතය පිළිබඳව අවබෝධයක් ලබා ගන්න උත්සාහ ගන්න

- **ආගමික නායකයින් සහ මෙම ගැටලුව පිළිබද ඔවුන්ගේ ස්ථාවරය ?**

ප්‍රදේශයේ සිටින ආගමික නායකයන් සොයා ගන්න. ගැටලුව සම්බන්ධයන් ඔවුන්ගේ ක්‍රියාකාරී සහ අකමන්‍යතාවය මෙන්ම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය පිළබඳ අවබෝධයක් ලබා ගන්න උත්සාහ ගන්න

- **ගැටලුවට එරෙහිව සටන් කිරීමේදී ප්‍රජාවේ සමාජිකයන් සතු ශක්තීන් මොනවාද?**

ගැටලුව විසදීම සඳහා දැනටමත් ප්‍රජාවේ පවතින හැකියාවන් ,කුසලතා, විශේෂඥතා තක්සේරු කරන්න

- **ගැටලුව සදහා විසඳුම් සෙවීමේදී ප්‍රජාවේ පවතින අනෙකුත් අවස්ථා මොනවාද ?**

ගැටලුව විසදීමට ප්‍රජාවට ප්‍රවේශ විය හැකි පුද්ගලයන්,සංවිධාන, ජාල යනාදිය අනුව යථාර්ථවාදී තක්සෙරුගත කිරීමක් කරන්න.

- **ගැටලුව සදහා විසඳුම් සෙවීමේදී ප්‍රජාවට පවතින බාධාක සහ දුර්වලතා මොනවාද?**

ගැටලුව සඳහා විසඳුම් සෙවීමේදී ප්‍රජාවේ පවතින දුර්වලතා ලැයිතුගත කරන්න. නිදසුනක් ලෙස අඩු අධ්‍යපනය, සම්බන්ධතා, විශ්වාසය, බාහිර සමාජයන් සමග ගැටීම, දෛනික කැපවීම, දේශපාලනික සහ සෘජුව පවතින පිරිවැය

- **ගැටලුව සදහා විසඳුම් සෙවීමේදී ප්‍රජාවට පවතින අභියෝග ?**

ප්‍රජාවක් ලෙස මුහුණ දෙන අභියෝග තක්සේරුගත කරන්න. මෙහිදී නිදහසේ රැස්වීමට සහ නිදහසේ සංවිධානය වීමට ඇති අභියෝගයන්, සේම දේශපාලඥයින්ගෙන් රාජ්‍ය නිලධාරීන්ගෙන් , පුද්ගලික සමාගම්වලින් හෝ අනෙක් ප්‍රජාවන්ගෙන් එල්ල වල අභියෝග විය හැකියි.

## ඇමුණුම 04: ආදර්ශ කතාන්දරය

ඌව පළාතට අයත් නෙලුම් කුලුම ගම්මානය පවුල් 500 ක ජනපදයකි. එහි ප්‍රධාන ජීවනෝපාය වන්නේ හේන් ගොවිතැනයි. නමුත් ගම්මානයේ 5% පමණ රජයේ රැකියා කරන අතර 5% පමණ පුද්ගලික රැකියාවල නිරත වෙයි. එසේම නෙලුම් කුලම ගම්මානයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ කරන සංවර්ධන නිලධාරීවරයෙක් සහ කොළඹ ඇගලුම් හළක සේවය කරන තාක්ෂණික සේවකයන් දෙදෙනෙක් ද මේ අතර සිටී. එහි එක් සේවකයෙක් ඇගලුම්හලේ කම්කරු සමිතියේ සමාජිකයෙකි.

2022 අගභාගයේදී  නෙලුම් කුලම ගම්මානය ඇතුලු ගම්මාන 6 කගේ ඉඩම් බලහත්කාරි ලෙස අත්පත් කර ගැනීමේ ගැටලුවකට මුහුණ දී සිටින්නේය. මෙහිදී හේන් ගොවිතැන කරන ඉඩම් අක්කර 2000ක් පුද්ගලික කොම්පැණියක් විසින් රජයේ අනුදැනුමෙන් වගා ව්‍යාපෘතියකට පවරා ගැනීමට යයි. මෙම ගොවි ඉඩම් අත්පත් කරගන්නවා යැයි  ගොවියන් විසින් දැනගන්නේ  කොම්පැණිය විසින් ඉඩම් සුද්ද කිරීම නිමිත්තෙන් සංවිධානය කළ උත්සවය සමගයි. මේ උත්සවයට ගමේ පොලිසියේ ලොකු මහත්තයාත් අමුත්තෙක් විදියට සහභාගී වී තිබිණී. එම අවස්ථාවේ ඉඩම් සුද්ද කිරීමට පැමිණි ඩෝසර්වලට ගමේ මිනිසුන් පාර හරස් කළ අතර එතන සිටි ගමේ තරුණයන් දෙදෙනෙක් ඩෝසර් සහ යන්ත්‍රවලට පහර දෙන්නට විය. ගම්වැසියන්ගේ ප්‍රචණ්ඩකාරී හැසිරීම නිසා පොලිසිය ඊට මැදිහත් වී විරෝධය තාවකාලිකව සමනය කළ අතර  දේපල වලට හානි කරා යන චෝදනා ගොණුකර පොලිසිය විසින් ගමේ තරුණයන් දෙදෙනෙක් ද අත්තඩංගුවට ගනු ලැබුවා.  මෙයාකාරයට ගමේ මිනිසුන්ගේ විරෝධයෙන් එම ආරම්භක උත්සවය නතර කිරීමට සංවිධායකයන්ට සිදු විය. ඒසේම මෙම කොම්පැනිය රටේ දෙමළ ජනතාව බහුතරයක් ජීවත්වන උතුරු පළාතේ ත් මේ ආකාරයෙන්ම බලහත්කාරීව ඉඩම් අත්පත් කර ගැනීම් සිදු කළ කරන ලදී. මේ ව්‍යාපෘතිය සිදු කිරීමෙන් පරම්පාරික ගොවිතැනේ නියැලෙන ගම්මානයේ ගොවි පවුල් 70% සෘජුවම  බලපෑමට ලක් වනු ඇත.

නෙලුම් කුලම ගමේ කෙලවරේ ඇති රක්ෂිතයට ආසන්නයේ (ගම්මානයේ ඇතුලට වෙන්න) පදිංචිව සිටින, ගම්මානයේ මුලු පවුල් සංඛ්‍යවෙන් 20%  ක් වන අඩු කුලයට අයත් පවුල්වලට මෙම ව්‍යාපෘතියෙන් සෘජුව නොමැති වුනත් වක්‍රව බලපෑමටකට ලක් වෙයි.  මීට අවුරුදු 30 පමණ පෙර රජය විසින් සිදු කළ දිළිදුකම පිටුදැකීම සහ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන  යටතේ අඩුකුලයට අයත් පවුල් කිහිපයක් නෙලුම් කුලමේ පදිංචි කරන ලදී. ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය කුලී වැඩ ය. නමුත් මීට අවුරුදු 2 පෙර මේ ප්‍රජාවේ හපනා කියන තරුණයා පළමුවරට ගමෙන් විශ්ව විද්‍යාලයට තෙරී පත් වීම ගමට විශාල ජයග්‍රහණක් විය. එසේම හපනා විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සමාගමයේ  ප්‍රබල සාමාජිකයෙක්ද විම විශේෂත්වයකි. ගමේ බොහොමයක් සාමාන්‍ය පෙළ හෝ සමත් වන්නේ කලාතුරකින් නිසා හපනාගේ හපන්කම ගමට ලොකු වත්කමකි. ගමේ ගෙදරක හෝ ඉඩමක හෝ  කුලි වැඩකට ඔවුන් පැමිණෙනවා මිස ගම්වැසියන් විසින් සිදු කරන පොදු කටයුත්තකට මෙම අඩු කුළයේ ප්‍රජාව සහභාගී කර ගන්නේ නැත.

ඒ වගේ ගමේ මායිමේ මුස්ලිම් ප්‍රජාව ජීවත් වන අතර අස්වැන්න මිලදී ගැනීමට ඒ ගමේ මුස්ලිම් වෙළඳුන් නෙලුම් කුලමට පැමිණෙයි.  එකිනෙකා අතර ව්‍යපාරික සම්බන්ධතා පමණක් පවතී.

මෙහිදී ගොවියන් බහුතරයක් මෙම ඉඩම් කොල්ලයට විරුද්ධ වු අතර එයින් රටේ පාර්ලිමේන්තුව තුළ ප්‍රධනා විරුද්ධ පක්ෂය නියෝජනය කරන දේශපාලන පක්ෂයට පක්ෂපාතී ගොවියන් තදින්ම පවතින දේශපාලන අධිකාරිය විවේචනයට ලක් කරයි.

බහුතරයක් වූ ගොවීන් කොම්පැණියෙන් වන්දි ලෙස මුදල් ලබා ගැනීමට අකමැති වුවත් හේන් ගොවිතැන ස්ථිර ආදායම කර නොගත් ස්වයං රැකියාව ප්‍රධාන ආදායම් මාර්ගය කරගත් ගම්වැසියන් කිහිපදෙනෙක් එම යෝජනාවට කැමති විය.

ගමේ මරණාධාර සමිතියේ සමිතියේ සභාපති වගේම පන්සලේ දායක සභාවේ පැරණිම සාමාජිකයෙක් වූ හිත හොඳ මාමාගේ යෝජනව වුයේ, පන්සලේ ලොකු හාමුදරුවෙන්ගෙන් උපදෙස් ගෙන මේ ප්‍රශ්නය පිළිබඳ නිවැරදි සහ විධිමත් පටිපාටියකට ඉහළ අංශ එක්ක කථා කරමු යන්නයි.

ගමේ ඇමති ලඟ රියදුරු රැකියාව කරන ඇමති මල්ලිගේ යෝජනාව වුයේ, ඇමතිතුමාට කියා ව්‍යපෘතියෙන් හානි වන අනෙකුත් ගම්මාන පහ සම්බන්ධයෙන් කිසිවක් කළ නොහැකි නමුත් ඇමතිතුමා ඔහුට ඇති පුද්ගලික හිතවත්කම් මත නෙලුම් කුලම ගමේ වගා ඉඩම් ටික බේරා දිය හැකි බවයි.

ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ යෝජනාව වුණේ, කොම්පැණිය සෑදුවාට පසු කොම්පැණියෙන් සිකුරිටි රස්සාවල් කිහිපයක් අපේ ගමේ තරුණයන්ට ලබාගැනීමට පුලුවන් බවයි.

කෙසේ නමුත්, බහුතරයක් වූ ගොවීන්ගේ විශ්වාසය වන්නේ තමන්ගේ පාරම්පරික වගා ඉඩම් කොම්පැණියට කොල්ලකෑමට ඉඩ නොදිය යුතු බවයි. අලීන් ගම් වැදීම, භූගත ජල මට්ටම පහත යාම, කොම්පැණිය විසින් භාවිතා කරන කෘෂි රසායන භෝග පරිසරයට එකතු වීමෙන් පරිසරය දුෂණය ආදී සියලු දෙනාටම බලපාන පිරිසරික ප්‍රශ්න ඇති විය හැකි බැවින් ගොවීන් සහ ගොවීන් නොවන අනෙකුත් ගම් වැසියන් ද මෙම ඉඩම් කොල්ලයට ඉඩ නොදිය යුතුය යන්න ගොවීන්ගේ අදහසයි.

***

(මෙය සත්‍ය සිද්ධියක් නොවන අතර මෙහි එන නම්, ගම් සහ චරිත මනඃකල්පිත බව කරුණාවෙන් සලකන්න)

## ඇමුණුම 05: මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශය

පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ආදර්ශ කතාවේ හඳුනාගත් විවිධ මානයන් මත පදනම්ව මැදිහත්වීමේ සැලැස්මක් සාදන්න

- සමාජ ව්‍යාපාරය විධිමත් කිරීමේ යෝජනාව
- සමාජ ව්‍යාපාරයට සමාජයේ විවිධ කොටස් වලින් සහභාගීත්වය ලබා ගැනීමේ යෝජනාව
- තරුණ සහ කාන්තා සහභාගීත්වය වැඩිකර ගැනීමට යෝජනා කිරීම
- ප්‍රජාව තුළ පවතින විවිධ අවශ්‍යතා පවතින / විසඳුම් ඇති හෝ ගැටලුවෙන් අඩුවෙන් /වක්‍රව බලපෑමට ලක්විය හැකි පුද්ගලයන්/උප කණ්ඩායම් සියලු දෙනාටම සමගියෙන් එක්ව කටයුතු කළ හැකි එක රාමුවක් යටතට ගෙන ඒමේ යෝජනාව
- සමාජ ව්‍යාපාරයට සම්බන්ධ වීම සහ එය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන ආකාරයට ප්‍රජාවේ දැනුම සහ දැනුවත්භාවය වැඩි කිරීමේ යෝජනාව
- ප්‍රජාවේ පවතින හැකියාවන් සහ ශක්තීන් ප්‍රයෝජනයට ගැනීමේ යෝජනාව
- පක්ෂ දේශපාලනයේ මැදිහත්වීම මෙහෙයවීමේ යෝජනාව
- සමාජ ව්‍යාපාරය තුළ බහුත්වවාදය දිරිගැන්වීමේ යෝජනාව

- ප්‍රජාවේ සමාජ ජාල පුළුල් කිරීමේ යෝජනාව
- සමාජ ව්‍යාපාරය තුළ ප්‍රජාවට රුස්වීම සහ සංවිධානය වීමේ නිදහස ආරක්ෂා කිරීමේ යෝජනාව
- සමාජ ව්‍යාපාරය තුළ ඇතිවිය හැකි අනෙකුත් අභියෝග සමඟ කටයුතු කිරීමේ යෝජනාව
- සමාජ ව්‍යාපාරයට බාධා කරන සහ අනෙකුත් දුර්වලතා හඳුනාගැනීමේ යෝජනාව
- ප්‍රාදේශීයව විශේෂිත වු විශාල ගැටලුවලට පිළිබඳ ඔවුන්ට සිතීමට යොමු කිරීම සහ දේශපාලන පරිවර්තනයක් සඳහා ඔවුන්ට කළ හැකි දායකත්වය සලකා බැලීමට ඔවුන් දිරිමත් කිරීම.
- සමාජ ව්‍යාපාරයේ සාර්ථකත්වය සහතික කිරීම සඳහා තීරණාත්මක යැයි ඔවුන් විශ්වාස කරන වෙනත් ඕනෑම යෝජනාවක් කිරීමට දිරි ගැන්වීම